[අන්තර්ජාල අනුවාදයකි]

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1999 අංක 31 දරන පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය පනත

---

[සහතිකය සටහන් කළේ **1999** සැප්තැම්බර් මස **23** වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1999 සැප්තැම්බර් මස 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු.11.25 තැපැල් ගාස්තුව : රු: 5.25

## 1999 අංක 31 දරන පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය පනත

[සහතිකය සටහන් කළේ 1999 සැප්තැම්බර් මස 23 වැනි දින.]

එල්.ඩී. - ඕ. 38/98.

**පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය පිහිටුවීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.

1. මේ පනත 1999 අංක 31 දරන පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක දී එය ක්‍රියාත්මක විය යුතු ය.

### I වැනි කොටස

### පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය පිහිටුවීම

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය පිහිටුවීම.

2. (1) (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය යනුවෙන් හඳුන්වනු ලබන්නා වූ ආයතනයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) ආයතනය, (1) වන උපවගන්තියෙන් ඊට දී ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් සංස්ථාව විසින් නඩු පැවරීම ද, සංස්ථාවට විරුද්ධව නඩු පවරනු ලැබීම ද, කරනු ලැබිය හැකි ය.

ආයතනයේ කර්තව්‍ය

**3**. පහත සඳහන් කර්තව්‍ය ආයතනයේ කර්තව්‍ය වන්නේ ය :-

(අ) පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල සභිකයින්ට, නිලධරයන්ට සහ සේවකයන්ට ඔවුන්ගේ රාජකාරී කටයුතු වඩාත් කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස ඉටු කිරීමට හැකිවන පරිදි ඒ සභිකයන්ට, නිලධරයන්ට හා සේවකයන්ට පුහුණුව සළසා දීම ;

(ආ) පළාත් හා පළාත් පාලන කළමනාකරණය පිළිබඳ වැඩමුළු හා පුහුණු පාඨමාලා පැවැත්වීම ;

(ඇ) ආයතනය විසින් පවත්වනු ලබන පුහුණු පාඨමාලා සාර්ථක ලෙස අවසන් කර ඇති තැනැත්තන්ට සහතික පත්‍ර ප්‍රදානය කිරීම ;

(ඈ) යහපත් රාජ්‍ය පාලනයක් ඇති කිරීම තහවුරු කිරීමේ අදහසින් රට තුළ ප්‍රවීණ පළාත් හා පළාත් පාලන නිලධරයන්ගෙන් හා පිරිස්වලින් සමන්විත සේවක ගණයක් ගොඩනැංවීමෙහි ලා සහාය වීම ;

(ඉ) පළාත් හා පළාත් පාලන කළමනාකරණය පිළිබඳ විශේෂඥයන්ගේ සේවය පළාත් සභාවලට හා පළාත් පාලන ආයතනවලට ලබා ගැනීමට සැළැස්වීම ;

(ඊ) පළාත් සභාවල සහ පළාත් පාලන ආයතනවල සංවිධාන පද්ධති හා කළමනාකරණ හැකියාවන් වැඩි දියුණු කිරීමෙන් ඒ පළාත් සභාවලට සහ පළාත් පාලන ආයතනවලට සහාය වීම ;

(උ) පළාත් හා පළාත් පාලන ක්ෂේත්‍රයේ උපදේශක තත්ත්වයේ පැවරුම් භාර ගැනීම ;

(ඌ) පළාත් සහ පළාත් පාලන ආයතනවල කළමනාකරණ පද්ධතිවල හා පරිචයන්හි විවේචනාත්මක ඇගයීමක් කිරීමෙහි ලා මණ්ඩපයක් ඇති කිරීම ;

(එ) කළමනාකරණ සංවර්ධනය සහ වැඩ පිළිබඳ ප්‍රතිමාන ස්ථාපනය කිරීම, වන්දි ගෙවීමේ ක්‍රම නිශ්චය කිරීම සහ සාමාන්‍යයෙන් පළාත් කළමනාකරණ සංවර්ධන සහ පුහුණු කිරීමේ ඒකකවල සහ පළාත් පාලන ආයතනවල ඵලදායකත්වය වැඩිදියුණු කිරීම පිණිස ඒ පළාත් කළමනාකරණ සංවර්ධන සහ පුහුණු කිරීමේ ඒකකවලට හා පළාත් පාලන ආයතනවලට සහාය වීම ;

(ඒ) ආයතනයේ පරමාර්ථ හා සමාන පරමාර්ථ ඇති, ශ්‍රී ලංකාව තුළ හෝ විදේශයන්හි පිහිටි වෙනත් සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීම ;

(ඔ) පළාත් සහ පළාත් පාලනය පිළිබඳ සම්මේලන සහ සම්මන්ත්‍රණ සඳහා අනුග්‍රහය දැක්වීම සහ පැවැත්වීම සහ ඒ පිළිබඳ පොත්පත් හා සඟරා පළ කිරීම ;

(ඕ) පළාත් පාලනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සකස් කිරීමේ කාර්ය සඳහා අමාත්‍යවරයාට අවශ්‍ය දත්ත හා තොරතුරු සැපයීම ;

(ක) ආයතනයේ කර්තව්‍ය හා කටයුතු පිළිබඳව අදාළ ආයතන හා මහජනතාව අතර තොරතුරු පතළ කිරීම ;

(ග) පළාත් සහ පළාත් පාලන ආයතනවල සියලු අංශයන් පිළිබඳව පර්යේෂණ පැවැත්වීම, ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා සහාය දැක්වීම.

4. ස්වකීය කර්තව්‍යයන් ඉටුකර ගැනීම සඳහා සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි බලතල ආයතනය වෙත තිබිය යුතු අතර, විශේෂයෙන් ම පහත සඳහන් බලතල තිබිය යුතු ය :- ආයතනයේ බලතල

(අ) යම් නිශ්චල හෝ චංචල දේපළක් යම් ආකාරයකින් අත්කර ගැනීම හා දැරීම, බදුදීම හෝ කුලියට දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ආ) පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීම හා පවත්වා ගෙන යාම;

(ඇ) එහි නිලධරයන් හා සේවකයන් පත් කිරීම, සේවයේ නියුක්ත කිරීම, පාරිශ්‍රමික ගෙවීම සහ ඔවුන් විෂයයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම ;

(ඈ) ආයතනය විසින් සලසනු ලබන යම් සේවාවක් සඳහා ගාස්තු හෝ මුදල් අය කිරීම ;

(ඉ) ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය යම් යන්ත්‍රෝපකරණ හා උපකරණ ආනයනය කිරීම සහ ආයතනයේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ, උපකරණ හා වෙනත් ආධාර ලබා ගැනීම ;

(ඊ) ආයතනයේ නිලධරයන් හා සේවකයන් සඳහා වැඩ ඉටු කිරීමේ ප්‍රමිතීන් පිහිටුවීම සහ එකී ප්‍රමිතීන්ට අනුකූලව ඒ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ වැඩ ඉටු කිරීම ඇගයීම සහ ඒ පිළිබඳව ක්‍රියා කිරීම ;

(උ) ආයතනයේ නිලධරයන් හා සේවකයන් සඳහා සුභ සාධක හා ක්‍රීඩා පහසුකම් ඇති කිරීම හා පවත්වාගෙන යාම ;

(ඌ) ආයතනයේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ පත්වීම්, පුහුණු කිරීම්, උසස් කිරීම්, පාරිශ්‍රමික ගෙවීම්, විනය පාලනය, හැසිරීම සහ නිවාඩු ලබාදීම ඇතුළු ඒ නිලධරයන් හා සේවකයන්ට අදාළ රීති සෑදීම ;

(එ) ආයතනයේ කර්තව්‍ය ඉටු කිරීමට අවශ්‍ය විය හැකි ගිවිසුම්වලට ඇතුලත් වීම ;

(ඒ) ආයතනයේ සාමාන්‍ය පරිපාලනය සම්බන්ධයෙන් රීති සෑදීම ; සහ

(ඔ) ආයතනයේ කාර්ත්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන හෝ ආනුෂංගික වන හෝ බලපාන වෙනත් සියලු දේ කිරීම.

පාලක සභාව පිහිටුවීම සහ එහි සංයුතිය

**5**. (1) ආයතනයේ කටයුතු පාරිපාලනය සහ කළමනාකරණය කිරීම පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත (මෙහි මින් මතු "සභාව" යනුවෙන් හඳුන්වනු ලබන) පාලක සභාවක් වෙත පවරනු ලැබිය යුතු ය.

(අ) නිලබලයෙන් සාමාජිකයන් වන තැනැත්තන්, එනම් :-

(i) සභාවේ සභාපති විය යුතු, පළාත් සභා හා පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ii) මුදල් හා ක්‍රම සම්පාදන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(iii) නිවාස සහ නාගරික සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(iv) පරිසර විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(v) රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(vi) සංස්කෘතික කටයුතු විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ;

(vii) උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන්නා වූ ද, විශ්වවිද්‍යාලයක පීඨයක් මගින් සපයනු ලබන අධ්‍යයන පාඨමාලාවක පළාත් පාලනය විෂයයක් වශයෙන් ඇතුළත්ව තිබෙන්නා වූ ද, විශ්ව විද්‍යාලයක පීඨාධිපතිවරයා ;

(viii) 12 වන වගන්තිය යටතේ පත් කරන ලද, සභාවේ කැඳවුම්කරු විය යුතු, ආයතනයේ අධ්‍යක්ෂවරයා ;

(ආ) පහත සඳහන් වෙනත් සාමාජිකයන්, එනම් :-

(i) අමාත්‍යවරයාගේ මතය අනුව පළාත් හෝ පළාත් පාලනය පිළිබඳ පළපුරුද්දක් ලබා ඇති පෞද්ගලික අංශයේ හෝ රාජ්‍ය නොවන සංවිධානවලින් තැනැත්තකු ;

(ii) අමාත්‍යවරයාගේ මතය අනුව පළාත් හෝ පළාත් පාලනය පිළිබඳ පළපුරුද්දක් ලබා ඇති වෘත්තීය සංවිධානයක තැනැත්තකු ;

(iii) පළාත් පාලන ආයතන සංගම්වලින් අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන තැනැත්තකු ;

(iv) අමාත්‍යවරයාගේ මතය අනුව පළාත් හෝ පළාත් පාලන විෂයයෙහි පළපුරුද්දක් ලබා ඇති තැනැත්තන් දෙදෙනකු ;

(2) යම් තැනැත්තෙක් -

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු වේ නම් හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු වුවහොත් ; හෝ

(ආ) ආයතනය විසින් හෝ ආයතනය වෙනුවෙන් සකසන ලද යම් ගිවිසුමක් යටතේ යම් අයිතිවාසිකමක් හෝ ප්‍රතිලාභයක් සෘජුව හෝ වක්‍රව දරන්නේ නම් හෝ භුක්ති විඳින්නේ නම් ; හෝ

(ඇ) ඒ තැනැත්තා හට සභාවේ සාමාජිකයකු වශයෙන් ස්වකීය කර්තව්‍යයක් ඉටු කිරීම කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකි යම් මූල්‍යමය හෝ වෙනත් යම් සම්බන්ධතාවක් තිබේ නම්

ඒ තැනැත්තා සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ එසේ කටයුතු කරගෙන යාමට නුසුදුස්සකු වන්නේ ය.

(3) 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරනු ලබන සෑම සාමාජිකයකු ම මියයාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම නිසා කලින් ධුරය අත් හරිනු ලැබුවහොත් මිස, අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු ය.

(4) (අ) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරන ලද සභාවේ සාමාජිකයකු මියගියහොත්, ඉල්ලා අස්වුවහොත් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් ඒ මියගිය, ඉල්ලා අස් වූ හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබූ සාමාජිකයා වෙනුවට වෙනත් තැනැත්තකු සාමාජිකයකු වශයෙන් අමාත්‍යවරයා විසින් එකී ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් පත් කරනු ලැබිය හැකි ය ;

(ආ) මෙම උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරනු ලැබූ සභාවේ යම් සාමාජිකයකු, ස්වකීය ධුරයෙන් කලින් ඉල්ලා අස්වුවහොත් හෝ මියයාම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා ධුරය අත්හැරියහොත් මිස තමා අනුප්‍රාප්තවන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(5) 5 වන වගන්තිය (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරනු ලබන සාමාජිකයකු රෝගාතුර වීම නිසා හෝ වෙනත් අබලතාවක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකිවන අවස්ථාවක, ඔහු වෙනුවෙන් වැඩ බැලීම සඳහා අමාත්‍යවරයා විසින් එකී ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

**6**. 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරන ලද සාමාජිකයකු, අමාත්‍යවරයා විසින් හේතු දැක්වීමෙන් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

සභාවේ පත් කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීමට අමාත්‍යවරයාට ඇති බලය

**7**. 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරන ලද සාමාජිකයකු විසින් අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

සභාවේ පත් කළ සාමාජිකයන් ධුරයෙන් ඉල්ලා අස්වීම.

**8**. 6 වන වගන්තිය යටතේ සේවයෙන් ඉවත් කරනු ලැබූ සාමාජිකයකු හැර, 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරන ලද යම් සාමාජිකයකු නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සකු වන්නේ ය.

සභාවේ සාමාජිකයකු ලෙස නැවත පත් කිරීම සඳහා යෝග්‍යතාව

**9**. සභාවේ යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ යම් සාමාජිකයකු පත්කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් ආයතනයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් බල රහිත වන්නේ යයි නොසැලකිය යුතු ය.

යම් පුරප්පාඩුවක්හෝ සාමාජිකයකු පත් කිරීමේ දෝෂයක් තිබීමේ හේතුවෙන් ආයතනයේ ක්‍රියා හෝ කටයුතු අවලංගු වන සේ සලකනු නොලැබිය යුතු බව.

**10**. මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි පාරිශ්‍රමිකයන්, ආයතනයේ අරමුදලින් සභාවේ සියලුම හෝ යම් සාමාජිකයකුට ගෙවනු ලැබිය හැකි ය.

සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

සභාවේ රැස්වීම්.

11. (1) අවම වශයෙන් සෑම මසකට එක් වරක් හෝ සභාවේ රැස්වීම් පවත්වනු ලැබිය යුතු ය.

(2) සභාවේ සෑම රැස්වීමක් පිළිබඳව ම අවම වශයෙන් දින හතක ලිඛිත දැන්වීමක් සභාපතිවරයා විසින් සභාවේ එක් එක් සාමාජිකයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඒ රැස්වීමේ දී ඉටු කරනු ලබන කටයුතු පිළිබඳව ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, සභාවේ විශේෂ රැස්වීමක් කැඳවන ලෙස සභාවේ සාමාජිකයන් දෙදෙනකු විසින් කරන ලද ලිඛිත ඉල්ලීමකින් පසුව, දින හතක් ඇතුළත සභාපතිවරයා විසින් සභාවේ විශේෂ රැස්වීමක් කැඳවිය යුතු ය.

(4) සභාවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් පස් දෙනකු විය යුතු ය.

(5) සභාපතිවරයා සභාවේ රැස්වීම්වල මූලාසනය දැරිය යුතු අතර, සභාවේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විටක පැමිණ සිටින සාමාජිකයන් වැඩිදෙනකු විසින් තෝරා පත් කර ගනු ලබන සාමාජිකයකු ඒ රැස්වීමේ මූලාසනය දැරිය යුතු ය.

(6) රෝගාතුර වීම නිසා හෝ වෙනත් අබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා සභාපතිවරයාට තම ධුරයේ කටයුතු තාවකාලිකව ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක දී අමාත්‍යවරයා විසින් සභාවේ වෙනත් සාමාජිකයකු ඔහු වෙනුවට වැඩ බැලීම සඳහා පත් කරනු ලැබිය හැකි ය.

(7) සභාවේ රැස්වීමක දී තීරණය කරනු ලැබීමට ඇති යම් කාරණයක් හෝ දෙයක් පිළිබඳව ඡන්දය සමානව ඇති අවස්ථාවක දී සභාපතිවරයාට ස්වකීය ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(8) මේ වගන්තියේ දක්වා ඇති විධිවිධාවලට යටත්ව සභාව විසින්, එහි රැස්වීම් පිළිබඳව සහ ඒ රැස්වීම් කටයුතු කරගෙන යාමේ කාර්ය පටිපාටිය පිළිබඳව තීරණය කරනු ලැබිය යුතු ය.

## II කොටස

## ආයතනයේ අධ්‍යක්ෂවරයා සහ ආයතනයේ වෙනත් නිලධරයන් හා සේවකයන් පත් කිරීම

**12.**(1) අමාත්‍යවරයා විසින්, අයතතනයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු (මෙහි මින් මතු "අධ්‍යක්ෂවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ආයතනයේ අධ්‍යක්ෂවරයකු ආයතනයේ කාර්ය මණ්ඩලයට පත් කළ යුතු ය. ආයතනයේ අධ්‍යක්ෂවරයා පත් කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලබන අධ්‍යක්ෂවරයා මිය යාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම නිසා කලින් ධුරය අත් හරිනු ලැබුවහොත් මිස, ස්වකීය පත්වීමේ දින සිට අවුරුදු පහක කාලයක් ධුරය දැරිය යුතු ය.

(3) සභාව විසින් අධ්‍යක්ෂවරයා වෙත පවරනු ලැබිය හැකි බලතල සහ කාර්තව්‍ය ඔහු විසින් ක්‍රියාත්මක කිරීම ද, ඉටු කිරීම ද කළ යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද අධ්‍යක්ෂවරයා අමාත්‍යවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(5) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිශ්‍රමිකයන් අධ්‍යක්ෂවරයාට ගෙවනු ලබිය යුතු ය.

(6) මිය යාමෙන්, (4) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් හෝ ඒ ධුරය දරන තැනැත්තා විසින් තත් කාර්ය සඳහා අමාත්‍යවරයා අමතන ලිපියක් මගින් ඉල්ලා අස්වීමෙන් අධ්‍යක්ෂවරයාගේ ධුරය හිස් වන්නේ ය.

(7) (4) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, අධ්‍යක්ෂරවයා ලෙස ධුරය දරන යම් තැනැත්තෙක් අධ්‍යක්ෂවරයා ලෙස නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(8) අධ්‍යක්ෂවරයාගේ ධුරයෙහි යම් පුරප්පාඩුවක් ඇති වුවහොත් (1) වන උපවගන්තිය යටතේ පත් කිරීමක් කරනු ලබන තෙක් අධ්‍යක්ෂවරයාගේ කාර්ය ඉටු කිරීම සඳහා අමාත්‍යවරයා විසින් සභාවේ සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

ආයතනයේ කාර්ය මණ්ඩලය පත් කිරීම සම්බන්ධව සභාවේ බලතල

**13**. (1) මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව -

(අ) ආයතනයේ කාර්යයන් සඳහා අවශ්‍ය විය හැකි වෙනත් නිලධරයන් හා සේවකයන් ආයතනයේ කාර්ය මණ්ඩලයට පත් කිරීම ;

(ආ) එවැනි නිලධරයන් සහ සේවකයන් සේවයෙන් නෙරපා දැමීම සහ ඔවුන් විෂයයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම ;

(ඇ) එවැනි නිලධරයන්ගේ හා සේවකයන්ගේ වේතන, වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නිශ්චය කිරීම ;

(ඈ) එවැනි නිලධරයන්ගේ හා සේවකයන්ගේ සේවා නියම සහ කොන්දේසි නිශ්චය කිරීම ; සහ

(ඉ) එවැනි නිලධරයන්ගේ සහ සේවකයන්ගේ ප්‍රතිලාභය සඳහා අර්ථසාධක අරමුදල් සහ යෝජනා ක්‍රම පිහිටුවා විධිමත් කිරීම සහ එවැනි අරමුදල් සහ යෝජනා ක්‍රමවලට දායක මුදල් ගෙවීම ;

සභාව විසින් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් සියලු ම කාරණා හෝ ඉන් කිසිවක් සම්බන්ධව මේ පනත යටතේ රීති සාදනු ලැබිය හැකි ය.

පත්වීම් සම්බන්ධයෙන්, සභාවේ බලතල, අධ්‍යක්ෂවරයා වෙත පැවරීම.

**14**. (1) ආයතනයේ කාර්ය මණ්ඩලයට වෙනත් නිලධරයන් හෝ වෙනත් සේවකයන් පත් කිරීමට අදාළව සභාවට ඇති සියලු ම බලතල හෝ ඉන් කිසිවක් සභාව විසින් අධ්‍යක්ෂවරයා වෙත පවරනු ලැබිය හැකි ය. මේ වගන්තිය යටතේ අධ්‍යක්ෂවරයා වෙත පවරන ලද බලතල යටතේ අධ්‍යක්ෂවරයා විසින් පත් කරන ලද යම් නිලධරයන් සහ සේවකයන්ගේ පාරිශ්‍රමිකයන් ඇතුළුව සේවා කොන්දේසි සභාවේ එකහත්වය ඇතිව අධ්‍යක්ෂවරයා විසින් නිශ්චය කළ යුතු ය.

(2) මේ වගන්තිය යටතේ අධ්‍යක්ෂවරයා විසින් ගනු ලැබූ යම් තීරණයකින් අතෘප්තියට පත් වූ යම් තැනැත්තකුට එම

තීරණයට එරෙහිව සභාව වෙත ලිඛිතව අභියාචනයක් ඉදිරිපත් කළ හැකි අතර, එම අභියාචනය පිළිබඳ සභාවේ තීරණය අවසානාත්මක විය යුතු ය.

(3) ආයතනයේ යම් නිලධරයකු හෝ සේවකයකු අධ්‍යක්ෂවරයා විසින් සේවයෙන් පහ කරනු ලැබීම සභාව විසින් එකී සේවකයන් පහකිරීම අනුමත කරනු ලැබ ඇත්නම් මිස, බලාත්මක නොවිය යුතු ය.

රජයේ නිලධරයන් ආයතනයේ කාර්ය මණ්ඩලයට පත් කළ හැකි බව.

**15**. (1) සභාවේ ඉල්ලීම පිට රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු ඒ නිලධරයාගේ හා රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, ආයතනයේ කාර්ය මණ්ඩලයට ආයතනය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාල සීමාවක් සඳහා තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් එවැනි ම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රජයේ සේවයේ යම් නිලධරයකු ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබ ඇති අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයා කෙරෙහි හා ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රජයේ සේවයේ යම් නිලධරයකු ආයතනයේ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලැබ ඇති අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයා කෙරෙහි හා ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) යම් නිශ්චිත කාල සීමාවක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමග ගිවිසුමකට ඇතුළත් වූ යම් තැනැත්තකු ආයතනය මගින් සේවයෙහි නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ආයතනය යටතේ සේවය කරන ලද යම් කාල සීමාවක් ඒ ගිවිසුම යටතේ වූ තැනැත්තාගේ බැඳීම් ඉටුකිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරන ලද සේවයක් වශයෙන් සළකනු ලැබිය යුතු ය.

III වන කොටස

## මුදල්

ආයතනයේ අරමුදල.

**16**. (1) ආයතනයට ආයතනයේ අරමුදලක් තිබිය යුතු ය.

(2) ආයතනයේ අරමුදලට පහත දැක්වෙන මුදල් බැර කරනු ලැබිය යුතු ය

(අ) ආයතනයේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල් ;

(ආ) මේ පනත යටතේ ආයතනයේ බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේදී ආයතනයට ලැබෙන සියලු මුදල් ; සහ

(ඇ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත කවර වූ හෝ ප්‍රභවයකින් ණය, ප්‍රදාන සහ පරිත්‍යාග වශයෙන් ආයතනයට ලැබෙන සියලු මුදල්.

(3) මේ පනත යටතේ ආයතනයේ බලතල සහ කාර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී ආයතනය විසින් දරන ලද වියදම් කිසිවක් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් හෝ අරමුදලින් ගෙවීමට මේ පනතේ යම් විධිවිධානයකින් නියමිත සියලු මුදල්, ආයතනයේ අරමුදලින් අය කළ යුතු ය.

ආයතනයේ මුදල් වර්ෂය.

**17**. ආයතනයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

ගිණුම් විගණනය.

**18**. ආයතනයේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ විය යුතු ය.

IV වන කොටස

## සාමාන්‍ය විධිවිධාන

ආයතනයේ සාමාජිකයන්, නිලධරයන් හා සේවකයන් රජයේ සේවකයන් වශයෙන් සැලකිය යුතු බව.

**19**. සභාවේ සියලු ම සාමාජිකයන් සහ ආයතනයේ සියලු ම නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා රජයේ සේවකයන් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

**20**. ආයතනය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් වශයෙන් සළකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව ආයතනය උපලේඛනගත ආයතනයක් ලෙස සැළකිය යුතු බව.

**21**. (1) මේ පනත යටතේ ස්වකීය කාර්තව්‍යයන් ඉටු කිරීමේ අරමුණින් හැර හෝ යම් නීතියක් යටතේ හෝ අධිකරණයක් විසින් එසේ කිරීමට නියම කරනු ලැබූ විට හෝ හැර, තමා විසින් මේ පනත යටතේ කාර්තව්‍යයන් ඉටුකිරීමේ දී ලබාගත් කිසිදු තොරතුරක් සභාවේ යම් සාමාජිකයකු විසින් හෝ ආයතනයේ නිලධරයකු හෝ සේවකයකු විසින් කිසිම තැනැත්තකුට හෙළි කරනු නොලැබිය යුතු ය.

තොරතුරු අනාවරණය කිරීමේ තහනම.

එසේ වුවද ආණ්ඩුව හැර වෙන යම් පාර්ශ්වයන් සමග ඇති කර ගත් ගිවිසුමක් මගින් රහසිගත ලෙස සැළකීමට බැඳී සිටින කිසිදු කාරණයක් පිළිබඳ තොරතුරක් මේ වගන්තියේ ඉහත විධිවිධාන යටතේ අනාවරණය නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන ඕනෑම පුද්ගලයකු මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

**22**. (1) ආයතනයේ කාර්යය සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීමට අවශ්‍ය වන්නා වූ ද, යෝජිත අත්කර ගැනීම ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයක් මගින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන්නා වූ ද අවස්ථාවක, ඒ දේපළ, මහජන කාර්යයක් සඳහා අවශ්‍ය යයි සළකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒ දේපළ ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කරගෙන ආයතනය වෙත පවරනු ලැබිය හැකි ය.

ආයතනය සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ නිශ්චල දේපළ අත්කර ගැනීම.

(2) ආයතනයේ කාර්යය සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම සම්බන්ධයෙන් ගෙවිය යුතු යම් මුදලක් ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

නිශ්චල හා චංචල රජයේ දේපළ ආයතනයට ලබාගත හැකි බව.

**23**. (1) ආයතනයේ කාර්යය සඳහා රජයේ යම් නිශ්චල දේපළක් අවශ්‍ය වන අවස්ථාවක, ඒ කාර්යය රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ ඒ දේපළ සම්බන්ධ විශේෂ ප්‍රදානයක් හෝ බදුදීමක් හෝ කළ හැකි කාර්යයක් ලෙස සළකනු ලැබිය හැකි අතර, ඒ අනුව ඒ ආඥාපනතේ විධිවිධාන ඒ දේපළ ආයතනයට විශේෂයෙන් ප්‍රදානය කිරීම හෝ බදු දීම සම්බන්ධයෙන් ආයතනයට අදාළ විය යුතු ය.

(2) ආයතනයේ කාර්යය සඳහා රජයේ චංචල දේපළක් අවශ්‍ය වන අවස්ථාවක ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් ඒ චංචල දේපළෙහි සන්තකය හා පරිහරණය ආයතනය වෙත පවරා, සතු කරනු ලැබිය හැකි ය.

එසේ වුවද, රජයේ යම් චංචල දේපළක් කෙරෙහි බලපාන්නා වූ කිසිම නියමයක් මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධානවලට අනුව, ඒ දේපළෙහි පාලනය ඇත්තේ යම් අමාත්‍යවරයකු යටතේ ද, ඒ අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මිස නොකළ යුත්තේ ය.

සභාව වෙත විශේෂ හෝ පොදු විධානයක් නිකුත් කිරීම සඳහා අමාත්‍යවරයා සතු බලතල

**24**. (1) ආයතනයේ බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳව අමාත්‍යවරයා විසින් සභාවට විශේෂ හෝ සාමාන්‍ය විධානයක් ලිඛිතව දෙනු ලැබිය හැකි අතර, සභාව විසින් ඒ විධාන ක්‍රියාත්මක කළ යුතු වන්නේ ය.

(2) ආයතනයේ කටයුතුවලට අදාළව තමාට අවශ්‍ය වන්නා වූ කිසියම් තොරතුරු ලිඛිතව තමා වෙත සපයන ලෙස අමාත්‍යවරයා විසින් කලින් කල සභාවට විධාන කරනු ලැබිය හැකි ය.

රීති.

**25**. (1) රීති සෑදීමට මේ පනතින් බලය දී ඇති සියලු කාරණා හෝ යම් කාරණයක් සම්බන්ධයෙන් සභාව විසින් රීති සාදනු ලැබිය හැකි ය ;

(2) අමාත්‍යවරයා විසින් අනුමත කරන්නේ නම් මිස, සභාව විසින් සකස් කරන ලද කිසිම රීතියක් බලාත්මක නොවිය යුතු ය.

මේ පනත යටතේ හෝ සභාවේ විධානය මත හෝ කරන ලද ක්‍රියා සඳහා ආරක්ෂාව.

**26**. (1) (අ) ආයතනය විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ආයතනයට විරුද්ධව ; හෝ

(ආ) සභාවේ යම් සාමාජිකයකු හෝ ආයතනයේ යම් නිලධරයකු, සේවකයකු හෝ නියෝජිතයකු විසින් මේ පනත යටතේ හෝ සභාවේ විධානය මත හෝ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව හෝ කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් එවැනි යම් තැනැත්තකු විසින්, මේ පනත යටතේ හෝ සභාවේ විධානය මත හෝ කරන ලද හෝ කරන ලදැයි අදහස් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියේ පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඒ ක්‍රියාව කරන ලද්දේ සද්භාවයෙන් යයි අධිකරණය තීරණය කරන්නේ නම්, ඒ නඩුවේ දී ඔහු විසින් දරන ලද යම් වියදමක් ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සභාවේ සාමාජිකයකුට හෝ ඔහුගේ දේපළට එරෙහිව රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

**27** ආයතනයට විරුද්ධව පවරනු ලැබූ යම් නඩුවක දී සභාවේ යම් සාමාජිකයකුට විරුද්ධව හෝ ඔහුගේ දේපළවලට විරුද්ධව කිසිම රිට් ආඥාවක් නිකුත් නොකරනු ලැබිය යුතු ය.

වැරදි හා දණ්ඩන.

**28**. මේ පනත යටතේ වරදක් සිදු කරන සෑම තැනැත්තෙක් ම මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට හය මසකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් පන්සියය නොඉක්මවන දඩයකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**29**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**30**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි -

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහනගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර,එවැනි යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම් කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරියක් ඊට ඇතුළත් වේ ;

"පළාත් සභාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ වන පරිච්ඡේදය යටතේ පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන්, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ හැර වෙනත් ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවනු ලැබුවා වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද, ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලින් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද, සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ ;

"විශ්ව විද්‍යාලය" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත යටතේ පිහිටුවනු ලැබූ විශ්වවිද්‍යාලයක් අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු.870 කි. (විදේශීය) රු.1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.